# හැකි නම් නිසි කල විකසිත වන්නට
# වෙහෙසෙනු කුමටද මුකුලිත වන්නට ...

## දරුවනේ,

### විවාහය...

අවුරුදු 18 ට අඩු ඔබ තවමත් ළමයෙකි.
ඔබේ ජීවිතය මල් වැනිය.
මලක සුන්දරත්වය දැකිය හැක්කේ
ස්වාභාවිකවම පිපුණු විටය.
අතට ගෙන පෙති දිගහැරි මලක
එය දැකිය නොහැකිය.
නිසිකලට නිසිදේ කිරීමෙන්
ජීවිතය වඩාත් සුන්දර වේ.



### ළමයෙකු ලෙස ඔබ කළ යුතු දේ...

- සාර්ථකව පාසල් අධ්‍යාපන කටයුතුවල නිරත වීම.
- විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරත වීම.
- යහපත් සමවයස් කණ්ඩායම් ඇසුරු කිරීම.
- සාර්ථකව අභියෝගවලට මුහුණ දීම හා අභියෝග ජයගැනීම.







**ඔබ**

යහපත් දරුවෙකු ලෙස
සිසුවෙකු ලෙස යහළුවෙකු ලෙස
නායකයෙකු ලෙස
යහපත් පුරවැසියෙකු ලෙස



නිවසට, රටට, සමාජයට
වැඩදායි පුද්ගලයෙකු වන්න.

# ආදරණීය දුවේ, පුතේ, ළමා විවාහ නිසා . . .

- ✓ ඉගෙනීම අතරමග නවතිනවා.
- ✓ යාළුවෝ නැති වෙනවා.
- ✓ ගෙදරින් ඈත් වෙන්න වෙනවා.
- ✓ ළමා නිවාසවලට යන්න වෙනවා.
- ✓ ළමා ලෝකයේ සුන්දරත්වය විඳින්න බැරි වෙනවා.
- ✓ අනාගත ඉලක්කවලට යන්න බැරිවෙනවා.
- ✓ සමාජයෙන් කොන් වෙන්න පුළුවන්.
- ✓ විවිධ ලිංගාශ්‍රිත රෝගවලට ගොදුරු වෙනවා.
- ✓ විවිධ මානසික රෝගවලට ගොදුරු වෙනවා.
- ✓ ළමා මවක් විදියට සමාජයේ තනිවෙන්න සිදුවෙනවා.
- ✓ ළමයෙක් වී තවත් ළමයෙක් බලාගැනීමට සිදුවෙනවා.
- ✓ විවාහ ජීවිතය එපා වෙනවා.





## මේ නිසා

- ✓ ජීවිතේ කලකිරෙනවා.
- ✓ පසුතැවෙන්න වෙනවා.
- ✓ පෞරුෂය බිඳවැටෙනවා.
- ✓ මානසික පීඩනයට පත් වෙනවා.
- ✓ මානසික රෝගවලට ගොදුරු වෙනවා.
- ✓ සමාජයට මුහුණ දෙන්න බැරිවෙනවා.



# නිසි වයසට එළඹෙන තුරු විවාහ නොවී සිටීමට ඔබට අයිතියක් ඇත.

විවාහ වීමට පෙර,

- ✓ සුදුසු පරිදි අධ්‍යාපන කටයුතු නිම කළ යුතුයි.
- ✓ මවක හෝ පියෙකු ලෙස වගකීම් දැරීමට ශාරීරිකව මෙන්ම මානසිකව ද සූදනම් විය යුතුයි.



විවාහ වීමට නම් අවම වශයෙන් වයස 21 වත් සම්පූර්ණ විය යුතුය.



එයට හේතු වන්නේ...
ඔබ ඒ වන විට,

- ✓ ශාරීරිකව සහ මානසිකව වර්ධනය වී සිටීම.
- ✓ ස්වාධීන පුද්ගලයෙකු වී සිටීම.
- ✓ සමාජයේ පරිසරය සහ අනෙකුත් පුද්ගලයින් හොඳින් තේරුම් ගැනීමේ හැකියාව වර්ධනය වී පැවතීම.

යන කාරණාවන්ය.



## අඩු වයසින් විවාහ වීමට, ඔබට හෝ ඔබගේ යහළුවෙක්ට බලපෑම් කරන්නේ නම්...

එවැනි අයෙක් ගැන ඔබ දැනුවත් නම්...

ඔබ ප්‍රදේශයේ,

ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී,
දැනුවත් කර උපකාර ලබා ගන්න.



නැතිනම් ...
ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ
**1929**
ශ්‍රී ලංකා ළමා දුරකථන සේවයට
කතා කරන්න...



එයින්
ඔබගේත් යහළුවාගේත්
අනාගතය සුරක්ෂිත වනු ඇත.

NATIONAL CHILD PROTECTION AUTHORITY SRI LANKA
ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය
ChildLine Sri Lanka
**1929**


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
අංක 330, තලවතුගොඩ පාර,
මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
දු.ක. 0112 778912-14
ෆැක්ස්: 0112 778915
වෙබ් අඩවිය: www.childprotection.gov.lk
විද්‍යුත් තැපෑල: ncpa@childprotection.gov.lk


Save the Children